

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

කාර්යසාධන වාර්තාව - 2022

දුම්රිය මුලස්ථානය
කොළඹ 10

පටුන

පිටු අංකය

01	**පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය**	**01**
1.1	හැඳින්වීම	01
1.2	ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු	02-03
1.3	ප්‍රධාන කාර්යයන්	03
1.4	සංවිධාන සටහන	04
1.5	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක හා මාර්ග ජාලය	06
1.6	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්	07
1.7	විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු	08
02	**පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම**	**09**
	විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි දැක්ම	
03	**පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**	**17**
3. 1	මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය	17
3. 2	මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය	19
3. 3	මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය	21
3. 4	මූල්‍ය ප්‍රකාශ සටහන	23
3. 5	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	23
3. 6	වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	23
3. 7	මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන	23
3. 8	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	24
3. 9	විගණකාධිපතිවරයාගේ වාර්තාව	24
04	**පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය**	**25**
4.1	ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)	25
05	**පරිච්ඡේදය- තිරසාර සංවර්ධන අරමුණු (SDG) පසුරා ගැනීමේ කාර්ය සාධනය**	**26**
5.1	හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න	26
5.2	තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න	26
06	**පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ**	**28**
6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	28
6.2	ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය	28
6.3	මානව සම්පත් සංවර්ධනය	28
07	**පරිච්ඡේදය -අනුකූලතා වාර්තාව**	**30**

01 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකීය ප්‍රවාහන පද්ධතියේ පුරෝගාමී මෙහෙවරක් සිදු කරන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 1864 දෙසැම්බර් 26 වන දින තම ප්‍රථම මංගල ගමන සනිටුවහන් කිරීමෙන් ආරම්භ කරන ලද තම මෙහෙවර වසර 159 ක් පුරාවට සිදු කරමින් පවතී.

ප්‍රධාන ප්‍රවාහන සැපයුම් මාධ්‍යයක් ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2022 වර්ෂයේදී ආර්ථික වර්ධනය සඳහා දායකත්වයක් දක්වමින් තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. 2022 වර්ෂයේදී මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල අඛණ්ඩ මෙහෙවරක යෙදෙමින් පරිසර හිතකාමී හා පිරිමැසුම්දායී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු කාර්යක්ෂමව ලබා දීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව රජයේ ප්‍රධාන දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව දුම්රිය ආඥා පනතේ ඇති විධිවිධානයන්ට යටත්ව කටයුතු ක්‍රියාත්මක කරනු ලබන අතර දුම්රිය සාමාන්‍යාධිකාරී දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශාඛා හා ඒකක 14 ක් යටතේ පරිපාලන කටයුතු විමධ්‍යගතවී තිබෙන අතර අදාල උප දෙපාර්තමේන්තුවේ, ශාඛාවේ, ඒකකයේ ප්‍රධානියා විසින් ඒ ඒ අංශයට පැවරී ඇති කාර්යයන් ක්‍රියාත්මක කරනු ලබයි.

රටේ සමස්ථ දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 21 ක් ආවරණය වන පරිදි මාර්ග කිලෝමීටර් 1,478.52 දිගු දුරකින් යුතුව සමස්ථ දුම්රිය ස්ථාන 418 ක් මගින් මගී ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කරනු ලබයි. තම මුඛ්‍ය පරමාර්ථය වූ මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායි, නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම හා පරිසර හිතකාමී හා පිරිමැසුම්දායී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට සමස්ථ කාර්යමණ්ඩලය ඉහළ කැපවීමකින් කටයුතු කරනු ලැබීය. 2022 වර්ෂයේදී ද ආර්ථික අර්බුදය හා බැඳුනු විවිධ බාධක හා අභියෝගයන් මධ්‍යයේ වුවද තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑමට හැකි විය.

මෙවැනි විවිධ බාධක හමුවේ වුවද මගී ජනතාව සඳහා කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් ලබාදීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගනු ලැබීය. ඒ අනුව චීනයෙන් හා ඉන්දියාවෙන් ආනයනය කරන ලද නවීන දුම්රියන් දුර ගමන් සේවා සඳහා යෙදවීම, නව දුම්රියන් හඳුන්වාදීම ආදිය මගින් මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවය සපුරා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යුහුසුළුව කටයුතු කරන ලදී.

දැක්ම

ශ්‍රී ලංකාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහනයේ
වඩාත් විශ්වසනීය
ප්‍රවාහන සැපයුම්කරු බවට පත්වීම

මෙහෙවර

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා
ආරක්ෂිත, විශ්වාසදායි
හා කාර්යක්ෂම
දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම


අරමුණු

- දුම්රිය මගී හා භාණ්ඩ ප්‍රවාහන අංශයන්හි දායකත්වය වර්ධනය කිරීම
- දුම්රිය මෙහෙයුම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- මගී දුම්රිය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- දුම්රිය කාර්ය මණ්ඩලයේ හා සම්පත් භාවිතයේ ඵලදායීබව වර්ධනය කිරීම
- දුම්රිය ආදායම වැඩි කිරීම
- මානව සම්පත සංවර්ධනය කිරීම
- දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- මගී ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරීම
- විශේෂ මගී දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන ව්‍යුහය


GENARAL MANAGER RAILWAY
A.G.M. (A)
A.G.M. (O)
A.G.M. (I)
A.G.M. (T)
A.G.M. (M)
C.F.O
DGM
DGM C
DGMT
CE(S)
CE(W)
CEM
CEMO
DGM(T)
D(A)
D P
DGMP
SRP
DIT
CIA
CA
DEC P&P
ST
SC
DES
DEw
DEBR
DEBU
DEME
DEM
DEMO
DGET
SS
SEP
SES
MAR
SE P&P
SEW
SEME
SEM
ADP
ASP
ASRP
ADE
AC
E P&P
AST
EP
ES
S
EW
CM
EE
EM
ATE
ATM
EM
ET
LGO
ADA

Level 1 **G. M. R** –General Manager railway

Level 2 **AGM(A)** – Addl. General Manager(Admin), **AGM(M)** - Addl. General Manager(Mechanical), **A. G. M. (M)** - Addl. General Manager(Infrastructure), **A**. **G. M. (O**)- Addl. General Manager(Operation), **C. F. O** – Chief Finance officer

Level 3 **DGM**-Deputy General Manager (Admin), **DGM(T**) - Deputy General Manager (Training & HR), **CEM** – Chief Engineer (Motive Power), **CME**- Chief Mechanical Engineer, **CE(W)** Chief Engineer (Way & works), **CSTE-** Chief Engineer (Signal & Telecommunication), , **DGM(C**) - Deputy General Manager (Commercial), **DGMT**- Deputy General Manager (Transport), **CIA**- Chief Internal Auditor, **CA**- Chief Accountant, SRP- Superintendent(RP), **DGMP** - Deputy General Manager (Procurement), **D P** – Director (Planning)

Level 4 **D(A)**-Director (Admin), **DCET** - Deputy Chief Engineer (Training & HRB), **DEMO** - Deputy Chief Engineer (Motive Power), **DEM**- Deputy Chief Engineer (Mechanical), **DEME** - Deputy Chief Engineer (Electrical), **DEW** - Deputy Chief Engineer (Way & Works), **DEBR** - Deputy Chief Engineer (Way & Bridges), **DEBU** - Deputy Chief Engineer (Property Development &Building), **DES** - Deputy Chief Engineer (Signal & Telecommunication), **SC** – Superintendent Commercial, **ST** – Superintendent Transportation

Level 5 **SEM** – SuperintendentEngineer(Motive Power), **SEME**- SuperintendentEngineer(Mechanical), **SEW** - SuperintendentEngineer(Way & works), **SS** – Surveyor Superintendent, **SES** - SuperintendentEngineer(Signal & Telecommunication), **SEP** -SuperintendentEngineer (Planning Project), **DSSM** – DeputySuperintendent (Sales & Marketing), **DIT** - DeputyDirector (Information Technology), **DSRP** - DeputySuperintendent (R. P), **SP** – Superintendent (Procurement)

Level 6 **ADA** – Assistant Director (Admin) / Deputy Director (Admin), **LGO** – Legal Officer, **ET** – Engineer (Training & HRB), **EM** – Engineer (Motive Power), **ATM** – Asst. Transportation Superintendent (Mechanical), **ATE** - Asst. Transportation Superintendent (Energy Conservation), **EM** – Engineer (Mechanical), **EE**– Engineer (Electrical), **CM** – Chemist & Methodologist, **EW** – Engineer (Way & Works), **S** – Surveyor, **ES** – Engineer (Signaling & Telecommunication), **EP** – Engineer (Planning & Project), **AC** – Asst. Director / Deputy Director (Cost), **AST**– Asst. Superintendent (Transportation / Commercial), **AC** – Accountant, **ADI** – Asst. Director (Information Technology), **ASRP**-Asst. Superintendent (R. P), **ASP**– Asst. Superintendent (Procurement), **ADP** – Asst. Director (Planning)

1.5 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක හා මාර්ග ජාලය

වගු අංක 01

උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක

#	උප දෙපාර්තමේන්තු/ඒකක	දෙපාර්තමේන්තුව / උප දෙපාර්තමේන්තු/ඒකක ප්‍රධානීන්
01 දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය දුම්රිය සාමාන්‍යාධිකාරී		
02	ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික)
03	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත)
04	ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල)උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු(ධාවන බල)
05	ප්‍රධාන ඉංජිනේරු (සංඥා සහ විදුලි සංදේශ) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි සංදේශ)
06	ගණකාධිකාරි උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන මූල්‍ය නිලධාරි
07	වාණිජ උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ)
08	දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ප්‍රසම්පාදන)
09	ගමනාගමන උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ගමනාගමන)
10	ශ්‍රී ලංකා දුම්රිය ආරක්ෂක සේවය	ආරක්ෂක අධිකාරි
11	ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පුහුණු හා මානව සම්පත්)
12	ප්‍රධාන පිරිවැය නිලධාරි කාර්යාලය	ප්‍රධාන පිරිවැය නිලධාරි
13	සැලසුම් ඒකකය	අධ්‍යක්ෂ (සැලසුම්)
14	දත්ත සැකසුම් ඒකකය	කළමනාකරු දත්ත සැකසුම්

වගු අංක 02

දුම්රිය මාර්ග ජාලය

මාර්ගය	දුර කි.මී.	දුම්රිය ස්ථාන සංඛ්‍යාව	උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව	දුම්රිය හෝල්ට්
මුහුදුබඩ මාර්ගය (කොළඹ කොටුව සිට බෙලිඅත්ත දක්වා)	186	41	34	0
ප්‍රධාන මාර්ගය(කොළඹ කොටුව සිට බදුල්ල දක්වා)	292.38	45	33	26
මාතලේ මාර්ගය (පේරාදෙනියේ සිට මාතලේ දක්වා)	33.75	05	06	15
පුත්තලම් මාර්ගය (රාගම සිට පුත්තලම දක්වා)	119.57	19	25	0
පුත්තලම අරුවක්කාලු මාර්ගය	37.00	1		
කැලණිවැලි මාර්ගය (මරදාන සිට අවිස්සාවේල්ල දක්වා)	59.27	11	19	7
වරාය මාර්ගය	7.00	1	-	-
කොලොන්නාව මාර්ගය	3.18	1	-	-
උතුරු මාර්ගය (පොල්ගහවෙල සිට කන්කසන්තුරය දක්වා)	339.47	31	26	17
තලෙමන්නාරම් මාර්ගය (මැදවච්චියේ සිට තලෙයිමන්නාරම දක්වා)	106.06	07	04	0
මිහින්තලේ මාර්ගය	13.50	01	0	2
මඩකලපු මාර්ගය (මහව සිට මඩකලපුව දක්වා)	211.11	14	17	05
ත්‍රිකුණාමල මාර්ගය (ගල්ඔය හංදියේ සිට ත්‍රිකුණාමලය දක්වා)	70.23	04	02	02
Total	**1,478.52**	**181**	**166**	**74**

2022 වසරේදී නව උප දුම්රිය ස්ථානයක් වශයෙන් නාකුළුගමුව උප දුම්රිය ස්ථානය ආරම්භ කරන ලදී.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ වෙනත් ආයතන හෝ අරමුදල් නොමැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

වගු අංක 03

#	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (ඇ.ඩො. මී.)	වර්තමාන ප්‍රගතිය
01	මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපන ව්‍යාපෘතිය	91.26	ක්‍රියාත්මක වෙමින් පවතී.
02	මගී මැදිරි 160 (ඉන්දියානු ණය ආධාර)	86.00	මිලදී ගැනීම් සිදුකර අවසන් කරන ලදී.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම..... .

සමස්ථ ප්‍රගතිය

ශ්‍රී ලංකා දුම්රිය සේවය (SLR) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ප්‍රවාහන සේවා සපයන්නෙකු ලෙස 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා ආර්ථිකයට සිය උපරිම සහ අඛණ්ඩ දායකත්වය ලබා දෙන ලදී. විවිධ අභියෝග සහ අනපේක්ෂිත තත්ත්වයන් මධ්‍යයේ වුවද, 2022 වසරේ දුම්රිය සේවය මගින් මගී සහ භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල නියැලුනි.

පසුගිය වසර දෙක තුළ රට මුහුණ දුන් Covid 19 වසංගත තත්ත්වය නිමවීමත් සමඟ 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා දුම්රිය තම සේවාව සාමාන්‍ය සේවාව අඛණ්ඩව පවත්වාගෙන යන ලදි.

මුළු ආදායම 2021 වසරේ රුපියල් මිලියන 2,678.72 සිට 2022 වසරේ රුපියල් මිලියන 11,076.10 දක්වා රුපියල් මිලියන 8,397.28 කින් වැඩි විය. සමස්ත ආදායමට ඇතුළත් සියලුම ආදායම් ඛාණ්ඩ 2022 දී විශාල වර්ධනයක් පෙන්නුම් කළේය. මගී ආදායම 2022 වසරේදී රුපියල් මිලියන 9,174.91 ක් වූ අතර එය පසුගිය වසර හා සසඳන විට මිලියන 7,556.50 ක වැඩිවීමකි. මෙලෙස ආදායම වැඩිවීම සඳහා බලපාන ලද්දේ ගමන් කරන මගීන් සංඛ්‍යාව කෝවිඩ් වසංගත සමයෙන් පසුව වැඩි වීමත් , වසර මැද භාගයේදී දුම්රිය ප්‍රවේශපත් ගාස්තු වැඩි වීමත්ය.

2022 වර්ෂයේ පුනරාවර්ථනය වියදම් වැඩිවීම හේතුවෙන් මුළු වියදම 5.2% කින් වැඩි විය. ඒ අනුව මුළු වියදම 2022 දී රුපියල් මිලියන 42,531.43 ක් වූ අතර එය 2021 දී රුපියල් මිලියන 40,416.06ලෙස වාර්තා විය. මුළු වියදම තුල පුනරාවර්තන වියදම් සහ ප්‍රාග්ධන වියදම් ඇතුළත් වේ. පුනරාවර්තන වියදම් 2022 දී සියයට 81.15 කින් 2021 සාපෙක්ෂව වැඩි වූ අතර 2022 දී මුළු පුනරාවර්තන වියදම් රුපියල් මිලියන 23,512.62 කි. 2021 දී එය රුපියල් මිලියන 12,979.21කි. ඉන්ධන වියදම් වැඩිවීම පුනරාවර්තන වියදම් ඉහළ යාමට ප්‍රධාන හේතුව විය. ප්‍රාග්ධන වියදම 2022 දී රු. මිලියන 19,018.81 ක් සහ 2021 දී රුපියල් මිලියන 27,436.85 ක් විය. 2022 දී ප්‍රාග්ධන වියදම අඩුවීම සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමා වීම ද හේතු විය.

මගී මැදිරි 200ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මැදිරි 100ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. මාර්ග ජාලයේ, සංඥා සහ විදුලි සංදේශ පද්ධතියේ සහ දුම්රිය ඇණියේ සියලුම නඩත්තු සහ වැඩිදියුණු කිරීම් සීමිත අයවැය ප්‍රතිපාදන තුළ අඛණ්ඩව සිදු කරන ලදී.

ඉන්දිය ණය පහසුකම් මත මගී මැදිරි 160 ක් මිලදී ගැනීමේ ව්‍යාපෘතියෙන් මගී මැදිරි සියල්ලම 2022 වසරේදී ප්‍රසම්පාදන කටයුතු අවසන් කරන ලදී. තවද, මගි හා භාණ්ඩ ප්‍රවාහනය කටයුතු වල ගුණාත්මකභාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීම, ආදී කටයුතු දුම්රිය සංවර්ධනය සඳහා 2022 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති වේ.

තවද මුහුදුබඩ දුම්රිය මාර්ගයේ දකුණු පයාගල සිට අළුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ මූලික සංවර්ධන කටයුතු ආරම්භ කිරීම හා පුත්තලම දුම්රිය මාර්ගයේ මීගමුව හා කුරුණෑ අතර ද්විත්ව දුම්රිය මාර්ගයේ වැඩ කටයුතු සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව පවතින අභියෝග ජයගනිමින් තිරසාර සංවර්ධන සංකල්ප අනුව ගමන් කිරීම සඳහා සියළු උත්සාහයන් දරනු ලබයි. එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා උපරිම කැපවීමෙන් යුතුව නිවැරදි දැක්මක් යටතේ දුම්රිය දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබයි. විශේෂයෙන් ඉන්දිය ණය ආධාර යටතේ හා චීන ණය ආධාර යටතේ මෙරටට ආනයනය කරන ලද සුඛෝපභෝගී දුම්රියන් මගි ජනතාවගේ ගමන් පහසුව සඳහා යොදාගෙන තිබේ. එමෙන්ම සංචාරක ප්‍රජාවන්ද ඉලක්ක කර ගනිමින් විශේෂ දුම්රියන් යොදවා තිබීම සංචාරක කර්මාන්තයේ දියුණුවටද ධනාත්මක බලපෑමක් වනු ඇත. තවද මගී නොවන ආදායම් මාර්ග ප්‍රවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් කිහිපයක්ම සැලසුම් කොට ඇත.

2022 වර්ෂයේදී දුම්රිය මඟින් මගීන් මිලියන 102.73 ක් ගමන් කල අතර මගී කිලෝමීටර් මිලියන 6,602.24ක දුර ප්‍රමාණයක් ධාවනය කර ඇත. එමෙන්ම භාණ්ඩ ටොන් මිලියන 1.75 ක් ප්‍රවාහනය කරමින් හා භාණ්ඩ ටොන් කිලෝමීටර් මිලියන 138.68 ක් ධාවනය කරමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සිය අඛණ්ඩ දායකත්වය ආර්ථිකය වෙත ලබා දී ඇත.

මූල්‍ය ප්‍රගතිය

2022 වසරේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව උපයාගත් ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දක්වා ඇත.

වගු අංක 04 ආදායම් හා වියදම් 2021 - 2022

	ආදායම් කාණ්ඩය	ආදායම (රු. මි.) 2021	ආදායම (රු. මි.) 2022
01	මගී	1,606.84	9,174.91
02	පාර්සල් සහ තැපැල්	59.00	296.98
03	භාණ්ඩ හා පශු සම්පත්	431.45	915.66
04	වෙනත්	581.45	688.53
එකතුව		**2,678.72**	**11,076.10**

වගු අංක 05 වියදම් කාණ්ඩ

වියදම් කාණ්ඩය	**වියදම රු. මි**
පුනරාවර්ථන වියදම	23,512.62
ප්‍රාග්ධන වියදම	19,018.81
එකතුව	**42,531.43**

දුම්රිය ගාස්තු වැඩි කිරීමත් කොවිඩ් තත්වයෙන් පසු දුම්රියෙන් ගමන් කරනු ලබන මගීන් සංඛ්‍යාව වැඩිවීමත්හේතුවෙන් දුම්රිය ආදායමේ සැලකිය යුතු වර්ධනයක් 2022 වසර තුළ පෙන්නුම් කරන ලදී. 2022 වර්ෂයේ මුළු අදායම රු. මි.11,076.10 ක් වූ අතර එය 2021 වර්ෂය තුළ රු. මි. 2,678.72 ක් විය. ඒ අනුව මුළු ආදායමේ 313 % ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

2022 වර්ෂයේ මුළු වියදම රු. මි. 42,531.43ක් වූ අතර මේ තුළ රු. මිලියන 23,512.62ක් පුනරාවර්තන වියදම හා රු. මි. 19,018.81ක් වූ ප්‍රාග්ධන වියදම ඇතුළත් විය.

වාණිජ කටයුතු

ආදාල කාලපරිච්ඡේදය තුළ දුම්රිය ආදායම් ඉහළ නැංවීම සඳහා පහත සඳහන් වාණිජ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

1. ඉන්දීය රජයේ ණය ආධාර යටතේ ලැබුණු ආහාර වර්ග බොහෝ ප්‍රදේශ කරා විශේෂ දුම්රියන් මගින් ප්‍රවාහනය කිරීම.

2. දුම්රිය ස්ථාන බඩු ගබඩා, දුම්රිය ස්ථාන ස්ථාවර භෝජනාගාර, දුම්රිය පරිශ්‍ර වලට අදාල සුළු අළෙවි සැල් ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඔස්සේ ලබාදීම.

3. දුම්රියෙන් කෘෂි භෝග නිෂ්පාදන ප්‍රවාහනය සඳහා සැලසුම් සකස් කිරීම.

4. වනවාසල සිට අරුවක්කාරු දක්වා දුම්රියෙන් කසල ප්‍රවාහනය සඳහා වන පරීක්ෂණ දුම්රිය ගමන්වාරයක් සිදුකිරීම හා ඊට අදාල ඉදිරි වැඩකටයුතු සැලසුම් කිරීම.

5. එළවළු ප්‍රවාහන කටයුතු සිදුකිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම.

යටිතල පහසුකම් සංවර්ධනය

2022 වර්ෂයේ දුම්රිය මාර්ග, ගොඩනැඟිලි, පාලම් සහ සංඥා පද්ධතිය යන අංශයන්හි පහත පරිදි ප්‍රධාන සංවර්ධන සහ නඩත්තු සංවර්ධන කටයුතු අඛණ්ඩව කරන ලදි.

- දුම්රිය මාර්ගයන්හි නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකිරීම.
- මහනුවර, පේරාදෙණිය සහ කඩුගන්නාව දුම්රිය මාර්ගය හා සම්බන්ධ කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- පුත්තලම් මාර්ගයේ ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කටුනායක දක්වා නිමකිරීම.
- නව දුම්රිය ස්ථාන ගොඩනැඟිලි ඉදිකිරීම, පාලම් නඩත්තු කිරීම සහ දුම්රිය ස්ථානයන්හි සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම අඛණ්ඩව සිදුකිරීම.
- සංඥා හා විදුලි සංදේශ පද්ධතිය වැඩිදියුණු කිරීමේ සහ නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකිරීම.
- පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මූලික සැළසුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- දකුණු පයාගල හා අලුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ මූලික සැළසුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

දුම්රිය ඇණිය

කාර්යක්ෂම මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවය සතු දුම්රිය ඇණිය සඳහා නඩත්තු හා අලුත්වැඩියා කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

ප්‍රධාන අළුත්වැඩියා කිරීම් 549ක ප්‍රමාණයක් සහ සුළු අළුත්වැඩියා කිරීම් ඒකක 10,287ක් මෙම කාලය තුළ සිදු කර ඇත. මගී මැදිරි පුනරුත්ථාපනය, බලවේග කට්ටල, එංජින්, ගැල් 04 ක් සහ රේල් බස් අළුත්වැඩියාව, එංජින් පුනරුත්ථාපනය කටයුතු, යන්ත්‍ර සහ උපකරණ අළුත්වැඩියා සහ නඩත්තු කිරීම මෙම කාලය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මගී මැදිරි 160 ක් 2022 වසරේදී ආනයනය කර අවසන් කර ඇත.

මගී මැදිරි 200ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මගී මැදිරි 100ක් පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර ඇති අතර ඉන් දැනට මගී මැදිරි 50ක් කටයුතු අවසන් කර ධාවනය සඳහා ඒක්කර ඇත.

මගී හා භාණ්ඩ ප්‍රවාහනය

2022 වර්ෂයේදී මගීන් 102.73 ගමන් කල අතර එය 2021 වර්ෂයට සාපේක්ෂව 185 % ක වැඩිවීමක් පෙන්නුම් කරයි. මෙලෙස මගීන් ගේ වැඩිවීම සඳහා ප්‍රධාන ලෙසම කෝවිඩ් තත්වය නිමවීම හේතුකොටගෙන මගීන් වැඩි සංඛ්‍යාවක් දුම්රිය භාවිතා කිරීම දැක්විය හැක.

වගු අංක 06 **ගමන්කළ මගී සංඛ්‍යාව හා මගී ආදායම**

වර්ෂය	ගමන්කළ මගීන් සංඛ්‍යාව (මිලියන)	මගී ආදායම රු. (මිලියන)	මගී කි. මී (මිලියන)
2021	35.96	1,606.83	2,158.16
2022	102.73	9,174.91	6,602.24

මෙම වසර තුළ නව දුම්රිය ගමන් වාරයන් 6 ක් ආරම්භ කරන ලදී.

1. කන්කසන්තුරය සිට වව්නියාව දක්වා - යාල්රාණි දුම්රිය (දිනකට ගමන්වාර 2 යි)
2. බදුල්ල සිට කොළඹ කොටුව දක්වා - ඇල්ල ඔඩීසි (තෝරාගත් දිනවල ගමන්වාර 2)
3. මීගමුව සිට කොටුව දක්වා - (දිනකට ගමන්වාර 2 යි)

භාණ්ඩ ආදායම හා ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය

වගු අංක 07

භාණ්ඩ ආදායම හා ප්‍රමාණය

වර්ෂය	භාණ්ඩ ආදායම රු. (මිලියන)	භාණ්ඩ ප්‍රමාණය (ටොන් මිලියන)	ටොන් කිලෝමීටර් ප්‍රමාණය (මිලියන)
2021	431.45	1.83	161.56
2022	915.66	1.75	138.68

- 2022 වර්ෂයේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු පිළිබඳව සැලකීමේදි භාණ්ඩ ප්‍රවාහන ආදායම 112% ක් වැඩිවී ඇති අතර භාණ්ඩ ටොන් ප්‍රමාණය 4.3 % ක් අඩුවී ඇත. ටොන් කිලෝමීටර් ප්‍රමාණය 14% ප්‍රමාණයකින්ද අඩුවීමක් පෙන්නුම් කරයි.

කාර්ය සාධන දර්ශක

වගු අංක 08

අංකය	කාර්ය සාධන දර්ශකය	2021	2022
01	ගමන් කළ මගී සංඛ්‍යාව (මිලියන)	35.96	102.73
02	මගී කි. මී. ප්‍රමාණය (මිලියන)	2,158.16	6,602.24
03	ප්‍රවාහනය කළ භාණ්ඩ ටොන් ප්‍රමාණය (මිලියන)	1.83	1.75
04	භාණ්ඩ ටොන් කි. මී. (මිලියන)	161.56	138.68
05	දුම්රිය කිලෝමීටර් ගනන	5,753,714.61	10,096,309.62

සමස්ථ දුම්රිය ධාවනය

වගු අංක 09

දුම්රිය ගමන්වාර

දුම්රිය සේවය	සැලසුම් කළ දුම්රිය සංඛ්‍යාව	ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව
තදාසන්න	25,880	24,084
ප්‍රාදේශීය	67,307	63,002
දුරස්ථභා නගරාන්තර	18,880	18,188
රේල් බස්	416	333
i මගී	**112,483**	**105,607**
ii භාණ්ඩ	**8,510**	**5,309**
එකතුව	**233,476**	**216,523**

ඉහත වගු අංක 09හි දැක්වෙන තොරතුරු අනුව 2022 වසර තුළ ධාවනය සඳහා සැලසුම් කළ මගී දුම්රිය සංඛ්‍යාව 112,483 ක් වූ අතර එයින් 105,607 ක් ධාවනය කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 93 % කි. රට තුල ව්‍යාප්ත වූ කෝවිඩ් වසංගත තත්වය අවසන් වී ජනතාව නැවතත් තම ගමන් සඳහා දුම්රිය භාවිතා කිරීම මෙලෙස ඉහළ දුම්රිය ගමන් වාර සංඛ්‍යාවක් පැවතීමට හේතුව වේ.

ස්ථිර මාර්ග පද්ධතිය හා ගොඩනැගිලි

ස්ථිර මාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රේල් පීලි මීටර් 180, 607ක් ද කොන්ක්‍රීට් සිල්පර 58,597ක් ද දැව සිල්පර 50,923ක් ද බැලස්ට් කියුබ් 19,223ක් ද භාවිතා කෙරිණි.

වගු අංක 10 **දුම්රිය මාර්ග නඩත්තුව සඳහා උපයෝගි කර ගත් ද්‍රව්‍ය**

යොදා ගත් ද්‍රව්‍ය	ප්‍රමාණය
රේල් පීලි (මීටර්)	112,523
දැව සිල්පර	42,080
වානේ සිල්පර	1,579
කොන්ක්‍රීට් සිල්පර	33,517
බැලස්ට් කියුබ්	12,316

සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

සංඥා පද්ධතියේ අඛණ්ඩව නඩත්තු කටයුතු සහ වැඩිදියුණු කිරීම කාර්යක්ෂම දුම්රිය සේවයක් ලබා දීම කෙරෙහි බලපාන වැදගත් සාධකයක් වේ. 2022 වසරේ ද සංඥා පද්ධතියේ වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් පහත සඳහන් කාර්යන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1. වැල්ලව දුම්රිය ස්ථානයේ යාන්ත්‍රික සංඥා පද්ධතිය ස්වයංක්‍රීය වර්ණ ආලෝක සංඥා පද්ධතිය දක්වා වෙනස් කිරීම
2. කුරුණෑගල හා වැල්ලව දුම්රිය ස්ථාන අතර ස්වයංක්‍රීය බ්ලොක් සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම.
3. පාදුක්ක හා වග දුම්රිය ස්ථාන අතර ස්වයංක්‍රීය බ්ලොක් සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම.
4. අනාරක්ෂිත දුම්රිය හරස්මාර්ග සඳහා ආරක්ෂිත හරස්මාර්ග පද්ධති 13 ක් ස්ථාපිත කිරීම.

අභියෝග හා ගැටලු

1. මගී හා භාණ්ඩ ප්‍රවාහනයට අවශ්‍ය යටිතල පහසුකම්හි පවතින අඩු ධාරිතාව.
2. සමස්ත දුම්රිය මාර්ග ජාලයේ පවතින අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම.
3. ප්‍රවේශ පත්‍ර නොමැතිව ගමන් කිරීම පාලනය කිරීමේ ගැටළු.
4. එංජින් ඇණියේ දගැටළු.
5. තාක්ෂණික අංශ වල පැවති අධික පුරප්පාඩු.
   දෛනික සේවා පවත්වා ගෙන යෑමේදී සියලුම අංශවල පවතින කාර්ය මණ්ඩල හිඟය නිසා අදාල කටයුතුවලදී ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වේ.
6. පුනරාවර්ථන වියදම්, විශේෂයෙන් අමතර කොටස් මිල කෙටි කාලයක් තුළ තුන් ගුණයකින් පමණ ඉහළ යාම.

දුම්රිය සේවාවේ ගුණාත්මක හා විශ්වසනීයත්වය ඉහළ නැංවීම සඳහා 2022 වසරේ ක්‍රියාත්මක කළ හා ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්

- ඉන්දියාවෙන් හා චීනයෙන් ආනයනය කරන ලද නව දුම්රිය මගී ප්‍රවාහන කටයුතු හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගැනීම.
- දේශීය වශයෙන් මගී මැදිරි පුනරුත්ථාපනය කිරීම.
- වායු සමීකරණය කරන ලද බලවේග කට්ටල 02 ක් ප්‍රසම්පාදනය කිරීම
- මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- කැළණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරීමේ මූලික කටයුතු සිදුකිරීම.
- මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම අවසන් කර එම ව්‍යාපෘතියේම දිගුවක් ලෙස තව මැදිරි 100 ක් පුනරුත්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කිරීම.
- ලෝක බැංකුව මගින් තොරාගත් දුම්රිය ස්ථාන 14ක සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම.
  (මුදල් අමාත්‍යාංශය - 10 , සංචාරක මණ්ඩලය - 04)
- එම ව්‍යාපෘතිය යටතේ මගී මැදිරි 80 ක සනීපාරක්ෂක පහසුකම් පුනරුත්තාපනය කිරීම.
- ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය

කොළඹ තදාසන්න දුම්රිය සේවාව වඩා කාර්යක්ෂම හා මගී ආකර්ෂණය සහිත සේවාවක් බවට පත් කිරීමේ අරමුණෙන් ප්‍රධාන, කැළණිවැලි, මුහුදුබඩ හා පුත්තලම දුම්රිය මාර්ග ආවරණය වන පරිදි දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ විශේෂ අරමුණ වේ. තදාසන්න ප්‍රදේශයේ මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම සංඥා හා විදුලි සංදේශ පද්ධතිය වැඩි දියුණු කිරීම, දුම්රිය ස්ථාන සංවර්ධනය කිරීම ආදී ව්‍යාපෘති කිහිපයක් මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වේ. කෙසේ වෙතත් රටේ පවත්නා ආර්ථික වාතාවරණය මත මෙම ව්‍යාපෘතියේ අරමුදල් නැවත භාණ්ඩාගාරය වෙත ගෙන ඇත.

තවද පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මූලික සැලසුම් සිදුකර ඇත.

- පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
- කුරුණෑගල සිට මහව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
- දකුණු පයාගල සිට අලුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
- ඉන්දියානු ණය ආධාර යටතේ රත්මලාන හා දෙමටගොඩ ධාවනාගාරයක් හා අංගනයක්ඉදිකිරීම.
- මහව සිට අනුරාධපුරය දක්වා සංඥා පද්ධතිය ස්ථාපිත කිරීම.
- එන්ජින් 12ක් ප්‍රසම්පාදනය කිරීම.

ඉදිරි දැක්ම

වර්තමාන රජයේ ප්‍රවාහන ප්‍රතිපත්තියේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මාර්ග තදබදය සඳහා විසඳුම් ලබාදීම සඳහා වඩාත් ප්‍රශස්ථ ප්‍රවාහන මාධ්‍යයක් වෙත යොමු වීමයි. ඒ අනුව මහා මාර්ගයේ ගමන් ගන්නා මගීන් හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු හැකි තරම් දුම්රිය මගින් සිදු කිරීම ප්‍රධාන අභිලාශයක් වේ. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනයේදී ප්‍රමුඛතා හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම මඟින් මගීන් සඳහා ඉතා කාර්යක්ෂම හා සකසුරුවම් දුම්රිය සේවාවක් ලබාදීම දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව දුම්රිය ඉදිරි සැළසුම් මෙම පරමාර්ථ මුල් කර ගනිමින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මේ යටතේ වඩාත් ආකර්ෂණීය හා පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවයේ පහත සඳහන් සාධනීය සංවර්ධනයන් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

- කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් පවත්වාගෙන යාම.
  පානදුර - කොළඹ - වේයන්ගොඩ, රාගම - කටුනායක - මිගමුව සහ මරදාන - හෝමාගම යන දුම්රිය සේවා සඳහා විදුලි දුම්රිය පද්ධතියක් හඳුන්වා දීම හා සාමාන්‍ය දුම්රිය සේවා වලට අමතරව සුඛෝපභෝගී කාර්යාලීය දුම්රිය සේවාවක් ආරම්භ කිරීම.
- දුම්රිය සේවාව නවීකරණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේද සහ ඩිජිටල්කරණය හඳුන්වා දෙමින් දුම්රිය ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සහ ආසන වෙන් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදය (Online) සේවාවක් සහ ඊ ප්‍රවේශපත්‍ර (E – Tickring) සහ ස්වයංක්‍රීය ඇතුළුවීමේ පිටවීමේ දොරටු ක්‍රමයක් හඳුන්වා දීම.
- භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවශ්‍ය දුම්රිය එංජින් ආනයනය කිරීම සහ දුම්රිය තට්ටු දේශීයව ඉදිකිරීම හා කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කන්කසන්තුරය යන වරාය වල දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වර්ධනය කිරීම

ඉදිරි සංවර්ධන ව්‍යාපෘති

01. මහව - ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය
02. කුරුණෑගල සිට මහව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම.
03. පුත්තලම දුම්රිය මාර්ගයේ මීගමුව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
04. පැරණි කැළණි පාලම නැවත ඉදිකිරීම
05. ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම
06. මගී මැදිරි දේශීයව නිෂ්පාදනය ආරම්භ කිරීම.
07. නව දුම්රිය සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම
08. මධ්‍යගතව අධීක්ෂණය කළ හැකි ආරක්ෂිත දුම්රිය හරස්මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම
09. මගී මැදිරි 200 ක් පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මැදිරි 100 ක් පුනරුත්තාපනය කිරීම
10. දකුණු පයාගල - අළුත්ගම දක්වා දුම්රිය මාර්ගය ද්විත්වකරණය කිරීම
11. කළුතර සහ පොල්ගහවෙල අතර විදුලි දුම්රිය සේවා ඇරඹීම.

03 පරිශේදය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3. 1 මූල්‍ය කාර්ය සාධනය
ඒසීඒ - එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල සීමාව සඳහා වන
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

අය වැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය (රු.)	ඉකුත් වර්ෂය (රු.)	
-	**ආදායම් ලැබීම**				
-	ආදායම් බදු	1			
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2			ඒසීඒ-1
-	අන්තර්ජාතික වෙළඳාම මත බදු	3			
8,900,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	10,335,603,441	2,678,724,989	
8,900,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		**10,335,603,441**	**2,678,724,989**	
	ආදායම් නොවන ලැබීම්				
10,014,174,990	භාණ්ඩාගාර අග්‍රිම		8,725,166,000	15,593,744,000	ඒසීඒ-3
-	තැන්පතු		1,462,574,820	1,488,928,093	ඒසීඒ-4
2,450,000,000	අත්තිකාරම් ගිණුම්		1,636,685,649	2,108,112,302	ඒසීඒ-515 (ඒ)
-	වෙනත් ලැබීම්		740,148,051	-	
12,464,174,990	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		**12,564,574,520**	**19,190,784,395**	
21,364,174,990	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		**22,900,177,961**	**21,869,509,384**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ(ඇ)		**126,785**	**2,203**	
21,364,174,990	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම නොවන		**22,900,051,176**	**21,869,507,181**	

අය වැය (වර්තමාන වර්ෂය)		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය (රු.)	ඉකුත් වර්ෂය (රු.)	
	අඩුකළා :- වියදම්				
	පුනරාවර්තන වියදම්				
11,091,200,000	වේතන, වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	11,082,993,345	9,598,762,425	
12,422,100,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	12,398,940,614	3,349,612,064	
33,500,000	සහනාධාර, සහනාධාර ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	30,686,137	30,837,886	ඒසිඒ-
	පොළී ගෙවීම්	**8**			
	වෙනත් පුනරාවර්තන වියදම්	**9**			
14, 102, 750, 000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**12,979,212,375**	**14,617,616,176**	
23,546,800,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**23,512,620,096**	**12,979,212,375**	
	මූලධන වියදම්				
3,546,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	3,534,188,812	4,172,012,950	
15,403,650,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	15,285,208,816	23,262,468,064	ඒසිඒ-
200,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	141,556	671,078	
	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**			
500,000	හැකියා වර්ධනය	**14**	481,120	1,703,227	
200,000,000	වෙනත් මූලධන වියදම්	**15**	198,790,847		
19,150,350,000	**මුළු මූලධන වියදම් (උ)**		**19,018,811,151**	**27,436,855,319**	
-	**ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)**		**3,640,399,957**	**3,708,199,750**	ඒසිඒ-4
	තැන්පතු ගෙවීම්		1,472,994,520	1,352,297,916	ඒසිඒ-
3,000,000,000	**අත්තිකාරම් ගෙවීම්**		2,211,673,416	2,288,102,041	5/5(ඒ)
	වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ගෙවීම්		-	-	
3,000,000,000	**ප්‍රාග්ධන වියදම් (ඌ)**		**3,684,667,936**	**3,640,399,957**	
45,697,150,000	**මුළු වියදම් (එ) = (ඊ+උ+ඌ)**		**46,216,099,183**	**44,056,467,651**	
(24,332,975,010)	**දෙසැම්බර් 31 දිනට ශේෂය (ඒ) = (ඉ-එ)**		**(23,316,048,007)**	**(22,186,960,470)**	
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		**(23,316,048,007)**	**(22,186,960,470)**	ඒ. සී. ඒ-7

3. 2මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය **ඒසීඒ - පී**

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය	
		වර්තමාන වර්ෂය රු	ඉකුත් වර්ෂය රු
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	484,263,351,242	481,800,503,833
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	9,687,438,087	9,112,450,320
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		1,804
මුළු වත්කම්		**493,950,789,329**	**490,912,954,153**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		9,094,697,424	8,509,289,955
දේපළ පිරියත හා උපකරණ සංචිතය		484,263,351,242	481,800,503,833
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	592,740,663	603,160,365
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		
මුළු වගකීම්		**493,950,789,329**	**490,912,954,153**

පිටු අංක 17 සිට 19 දක්වා දක්වා දැක්වෙන ඉහත ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 21 සිට 24 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා නිවැරදි බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන් දීමේ නිළධාරී	ගණන් දීමේ නිළධාරී	ප්‍රධාන මූල්‍ය නිළධාරී/
නම -එම්.එම්.පී.කේ මායාදුන්නෙ	නම - ඩබ්. ඒ. ඩී. එස් ගුණසිංහ	නම - පී. ඩී. ආර්. එම් දිවාමනී
තනතුර- ලේකම්	තනතුර- දුම්රිය සාමාන්‍යාධිකාරී	තනතුර - ප්‍රධාන මූල්‍ය නිළධාරී
දිනය- 2023.11.28	දිනය-2023.11.25	දිනය - 2023.11.24

එම්. එම්. පී. කේ. මායාදුන්නෙ
ලේකම්
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය
7 වෙනි මහල, සෙත්සිරිපාය (අදියර II)
බත්තරමුල්ල

ඩබ්ලිව්.ඒ.ඩී.එස්. ගුණසිංහ
දුම්රිය සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

P. D. R. M. DIWAMANI
Chief Financial Officer
Chief Accounts Office
Colombo - 10.

3. 3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ - සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	වර්තමාන වර්ෂය රු	ඉකුත් වර්ෂය රු
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුලු බදු ලැබීම්		
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	10,335,603,441	2,678,724,888
ලාභ		
ආදායම් නොවන ලැබීම්		
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	975,426,930	989,401,977
අග්‍රිම ලැබීම්	8,725,166,000	15,593,744,000
අත්තිකාරම් අය කර ගැනීම්	1,622,644,660	2,106,852,413
තැන්පතු ලැබීම්	1,462,574,820	1,488,928,093
පෙර වර්ෂය වෙනුවෙන් භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	**23,121,415,851**	**22,857,651,371**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි	12,662,519,043	10,749,638,574
මූලධන වියදම්	3,722,902,357	416,555,181
වෙනත් පුනරාවර්තන වියදම්	3,523,488,834	4,163,177,509
සහනාධාරසහ මාරුකිරීම්	30,686,137	30,837,886
වෙනත්වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	950,748,547	155,411,995
ආදායමින්ආපසු ගෙවීම්	-	-
භාණ්ඩාගාරයටපියවන ලද අග්‍රිම	126,785	2,203
අත්තිකාරම්ගෙවීම්	1,943,149,383	2,024,513,440
තැන්පතු ගෙවීම්	1,472,994,520	1,352,297,916
මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**20,783,126,772**	**18,478,253,826**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**2,338,289,079**	**4,379,397,545**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-

	තත්‍ය	
	වර්තමාන වර්ෂය රු	ඉකුත් වර්ෂය රු
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කරගැනීම්	3,078,437,130	4,379,397,545
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**3,078,437,130**	**4,379,397,545**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(3,078,437,130)**	**(4,379,397,545)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(740,148,051)**	-
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දුම්රිය සාමාන්‍යාධිකාරීගේ අපෞද්ගලික ගිණුමට ලැබීම්	740,148,051	-
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**740,148,051**	**-**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පත් ගිණුම් හා අනෙකුත් වගකීම්වල වෙනස්වීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**740,148,051**	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**-**

3. 4 මූල්‍ය ප්‍රකාශ සටහන

3. 5ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු.000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2001.01.00	දුම්රිය	8,900,000	8,900,000	10,335,603	116%

3. 6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. 000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	21,565,800	23,546,800	23,512,620	100%
මූලධන	11,140,700	19,150,350	19,018,811	99%

3. 7මු. රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනයේ % ලෙස
			ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
		අදාල නැත				

3. 8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. 000

වත්කම් කේතය	කේත විස්තරය	2022.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණය වාර්තාව අනුව ශේෂය	2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැඟිලි හා ව්‍යුහයන්	860,694	860,694		100%
9152	යන්ත්‍රෝපකරණ	73,217,628	73,217,628		100%
9153	ඉඩම්	410,184,551	410,184,551		100%
9154	අස්පෘෂ්‍ය වත්කම්				
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ	478	478		100%
9180	බදු දෙන ලද වත්කම්				

3. 9 විගනකාධිපති වරයාගේ වාර්තාව

**පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව ඇමුණුම් 01 මගින් දැක්වේ

04 පරිච්ඡේදය

කාර්යසාධනය

4. 1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
දිනකට ක්‍රියාත්මක වනු ලබන මගී දුම්රිය සංඛ්‍යාව		√	
දිනකට ක්‍රියාත්මක වනු ලබන භාණ්ඩ දුම්රිය සංඛ්‍යාව		√	
ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව			√
ඉදිකරන ලද දුම්රිය මාර්ග දිග (කි. මී)		√	

05 පරිච්ඡේදය

තිරසාර සංවර්ධන අරමුණු(SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5. 1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්ක / අරමුණු	ඉලක්ක	ජයග්‍රහන දර්ශකය	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
			100% - 90%	75% - 89%	50% - 74%
කර්මාන්ත නවෝත්පාදන හා යටිතල පහසුකම්	2030 වර්ෂය වන විට දුම්රිය මාර්ග ජාලයේ අත්‍යාවශ්‍ය මාර්ග ඉදිකිරීම් හා තිබෙන දුම්රිය මාර්ග පුනරුත්තාපනය කිරීම් හා නව සංඥා පද්ධතියක් ස්ථාපිත කරමින් කාර්යක්ෂම දුම්රිය සේවාවක් ලබාදීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තවද මගී හා භාණ්ඩ ප්‍රවාහනයට අවශ්‍ය එංජින් බලවේග කට්ටල දුම්රිය මැදිරි හා භාණ්ඩ ප්‍රවාහන වැගන් අළුතින් එකතු කිරීමෙන් හා පුනරුත්ථාපනය කිරීමෙන් සුවපහසු, කාර්යක්ෂම, ආරක්ෂිත මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා කටයුතු කිරීම	1. භාණ්ඩ ප්‍රවාහන දුම්රිය සංඛ්‍යාව		√	
		2. දිනකට ක්‍රියාත්මක වන දුම්රිය සංඛ්‍යාව		√	
		3. ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව			√
		4. ඉදිකල දුම්රිය මාර්ග (දිග. කි. මී)		√	

5. 2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී ජයග්‍රහණ හා අභියෝග

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවය පහත සඳහන් පරිදි කාර්යයන් හඳුනා ගන්නා ලදී.

ඒ අනුව 2022 වර්ෂයේ දී තිරසාර සංවර්ධන කාර්යයන් පහත සඳහන් පරිදි හඳුනා ගත හැකිය.

	දර්ශකයන්	ප්‍රමාණය
1	දිනකට ගමන් කරනු ලබන දුම්රිය ප්‍රමාණය	386
2	ප්‍රධාන දුම්රිය ව්‍යාපෘති සංඛ්‍යාව	05
3	භාණ්ඩ ප්‍රවාහන ව්‍යාපෘති සංඛ්‍යාව	04

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් අභියෝගයන්ට මුහුණදෙන ලදී.

1. මහා පරිමාණ දුම්රිය සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සීමා කිරීම.
2. දුම්රිය රක්ෂිතයන් තුළ අනවසර පදිංචිකරුවන් සිටීම.
3. වෘත්තීය සමිති ක්‍රියාකාරකම්.
4. කාර්යමණ්ඩල ගැටළු.
5. දුම්රිය රක්ෂිත සම්බන්ධ ගැටළු.
6. පර්යේෂණ හා සංවර්ධන කටයුතු සීමා වීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6. 1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	212	136	76
තෘතීය	451	142	309
ද්විතීක	11373	5386	5987
ප්‍රාථමික	8601	6152	2449

6. 2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් භිගය

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ මෙහෙවර හා දැක්ම සාක්ෂාත් කර ගැනීම උදෙසා නියමිත පටිපාටිගත කාර්ය මණ්ඩලයක් සිටීම අත්‍යාවශ්‍ය කරුණක් වන අතර පුරප්පාඩු වූ කාර්ය මණ්ඩලයක් තුළින් අපේක්ෂිත ඉලක්ක සාධනය කර ගත නොහැකි වේ.

මේ සඳහා විශේෂයෙන්ම දුම්රිය දෙපාර්තමේන්තුවේ තාක්ෂණික හා මෙහෙයුම් කාර්ය මණ්ඩලය මගින් සිදු කරන රාජකාරි(Out Source) බාහිර පාර්ශවයන් වෙත මුදල් ගෙවා සපුරා ගැනීම හෝ වෙනත් ක්‍රම වලින් සපුරා ගැනීමට අපහසු වේ.

6. 3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය(දේශීය / විදේශීය)	නිමාව / ලබාගත් දැනුම*
			දේශීය රු.	විදේශීය		
කාර්යාල රාජකාරි වල කාර්යක්ෂමතාව නැංවීමේ දේශන මාලාව	118	2022.03.29 2022.03.31 2022.04.05 2022.04.07	රු.9000.00		දුම්රිය මූලස්ථානය ශ්‍රවනාගාරයේදී භාහිර සම්පත් දායකයින් යොදාගෙන	කාර්යාල ලිපි ගොනුකරණය,
දෙමළ භාෂා පුහුණුව	117	2022.11.03 - 2023.12.17	රු.75,000.00		රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගනිමින්	දෙමළ භාෂා හැකියාව
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	204	2022.10.06/ 2022.11.16	නැත		බාහිර සම්පත් දායකයෙක් මගින්	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව
රැකියාව,වගකීම,කාල කළමනාකරණය හා ආතති කළමනාකරණය	59	2022.08.02	රු.14,400.00		බාහිර සම්පත් දායකයෙක් මගින්	රැකියාව,වගකීම,කාල කළමනාකරණය හා ආතති කළමනාකරණය පිළිබඳ දැනුම
තොරතුරු දැන ගැනීමේ පනත හා එහි ප්‍රායෝගික භාවිතය	80	2022.08.02			බාහිර සම්පත් දායකයෙක් මගින්	තොරතුරු දැන ගැනීමේ පනත හා එහි ප්‍රායෝගික භාවිතය පිළිබඳ දැනුම

සාමාන්‍ය හැසිරීම හා විනය	110	2022.07.22, 2022.08.08/09	රු.43,200.00		බාහිර සම්පත් දායකයෙක් මගින්	සාමාන්‍ය හැසිරීම හා විනය පිළිබඳ දැනුම
හානි පාඩු ලේඛනය පවත්වා ගැනීම හා මුදල් රෙගුලාසි	50	2022.07.05	රු.6000.00		දෙපාර්තමේන්තු සම්පත් දායකයෙකු යොදා ගෙන	හානි පාඩු ලේඛනය පවත්වා ගැනීම හා මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම
මානව සම්පත් සංවර්ධන සැලැස්ම සහ කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම	60	2022.11.03	රු.2400.00		බාහිර සම්පත් දායකයෙක් මගින්	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සහ කාර්ය සාධන ගිවිසුම් සකස් කිරීම පිළිබඳ දැනුම

❖ **ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන්වල දායකත්වය**

මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන සේවක මහතුන් සඳහා පුහුණු වැඩසටහන් ලබාදීම තුළින් අඩු පිරිවැයක් යටතේ උපරිම කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා ගැනීමට හැකියාව ලැබේ. එමෙන්ම ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම සඳහා නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප සංවර්ධනය අත්‍යවශ්‍ය බැවින්, මෙම පුහුණු වැඩසටහන් ඒ සඳහා උපකාරී වේ.

මෙහෙයුම් හා තාක්ෂණික හා කළමනාකරණ සේවාවල නියුතු නිළධාරීන් සඳහා, විශේෂයෙන් විදේශ පුහුණු අවස්ථා ලබාදීම වැදගත් පුහුණු වැඩසටහන් තුළින් කාර්යමණ්ඩලය දැනුම හා අත්දැකීම් හුවමාරු කර ගැනීම හැකිවේ.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ. /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ක්‍රියා මාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1. 1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1. 2	රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1. 3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	-	-	-
1. 4	ගබඩා අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1. 5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-	-	-
1. 6	වෙනත්		-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මූ. රෙ. 445)**			
2. 1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 2	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 5	සියලුම මාසික ගිණුම් සාරාංශ (සිගාස්) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2. 6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 8	තොග ලේඛනය යවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 9	හානි පාඩු ලේඛනය යවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 10	බැරකම් ලේඛනය යවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
2. 11	උප පත්‍රිකා පොත් (ජීඒ-එන් 20) ලේඛනය යවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ. /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ක්‍රියා මාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු. රෙ. 135)**			
3. 1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා තිබීම	අනුකූල වේ	-	-
3. 2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ අයතනය තුල දැනුවත් කිරීම	අනුකූල වේ	-	-
3. 3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3. 4	2014. 05. 11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැළස්ම සකස් කිරීම**			
4. 1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4. 2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4. 3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4. 4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4. 5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**		-	-
5. 1	විගණකාධිපති වරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**		-	-
6. 1	මු. රෙ 134(2) DMA/1-2019අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගනණ සැළසුම් සකස් කිරීම	අනුකූල වේ	-	-
6. 2	සෑම අභ්‍යන්තර විගනන වාර්තාවකටම මාසයක කාලයක් ඇතුලත පිළිතුරු සපයා තිබීම	අනුකූල නො වේ	උප දෙපාර්තමේන්තු කිහිපයක් පිළිතුරු එවා නැත	විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී සාකච්ඡා කර දැනුම් දීම මගින් නිසි වේලාවට පිළිතුරු ගෙන්වා ගැනීම

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ. /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ක්‍රියා මාර්ග
6. 3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්ති ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	-	-
6. 4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභයන්තර විගණන වාර්තා පිටපත් විගනකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7. 1	DMA චක්‍රලේඛ 1-2019 අනුව. අවම වශයෙන් විගනණ හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8. 1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේකයේ 07 පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණ කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
8. 2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්පුට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.	-	-
8. 3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
8. 4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුල සිදු කොට තිබීම	අනුකූල වේ.	-	-
8. 5	ගර්හිත වාහන අපහරණය කිරීම මු. රෙ. 772 අනුව	අනුකූල වේ.	-	-

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ. /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ක්‍රියා මාර්ග
9	**වාහන කළමණාකරණය**			
9. 1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ.	-	-
9. 2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ.	-	-
9. 3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ.	-	-
9. 4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු. රේ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම.	අනුකූල වේ.	-	-
9. 5	2016. 12. 29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන ව. ලේ 3. 1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ.	-	-
9. 6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ.	-	-

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ. /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ක්‍රියා මාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10. 1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	-	-
10. 2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.	-	-
10. 3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11. 1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.	-	-
11. 2	මු. රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ.	-	-

12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12. 1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.	-	-
12. 2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.	-	-
12. 3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අනුකූල වේ.		
13	**පොදු තැන්පත් ගිණුම**			
13. 1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මූ. රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.	-	-
13. 2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ.	-	-

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ. /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ක්‍රියා මාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14. 1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.	-	-
14. 2	මූ. රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම ඒම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ.	-	-
14. 3	මූ. රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.	-	-
14. 4	අග්‍රිම ගිණුම් ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳීම	අනුකූල වේ.	-	-
15	**ආදායම් ගිණුම**			
15. 1	අදාල රෙගුලාසි වලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.	-	-
15. 2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.	-	-
15. 3	මූ. රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16. 1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-
16. 2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරි ලැයිස්තුව ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.	-	-
16. 3	20. 09. 2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	-	-

අංකය	අදාල කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ. /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ/ක්‍රියා මාර්ග
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17. 1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන	අනුකූල වේ.	-	-
17. 2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳව මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.	-	-
17. 3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කිරීම	අනුකූල වේ.	-	-
18	**පුරවැසි ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීම**			
18. 1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්ති සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබේද	අනුකූල වේ.	-	-
18. 2	එම චක්‍රලේඛයේ 2. 3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19. 1	2018. 01. 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්ම සකස් කොට තිබීම	අනුකූල වේ.	-	-
19. 2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙක් සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.	-	-
19. 3	ඉහත සඳහන් චක්‍රලේඛනයේ ඇමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.	-	-
19. 4	ඉහත චක්‍රලේඛනයේ 6. 5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිලියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිලිබඳ වගකීම් පවරා ජ්ෂ්ඨ නිළධාරියෙකු පත් කොට තිබීම කර පවත්වාගෙන යාම	අනුකූල වේ.	-	-